# පරිභෝජනයට සුදුසු ම යාපනයේ රතුළූණු

මෙරටට ආනයනය කරනු ලබන අත්‍යාවශ්‍ය ආහාර බෝග අතුරින් සාපේක්ෂව අවම මුදලක් වැය කරන්නේ රතුළූණු ආනයනය සඳහා ය. මෙරට වාර්ෂික රතුළූණු අවශ්‍යතාවය මෙ.ටො.70,000 පමණ වන අතර ඉන් 80%ක් ම දේශීය වශයෙන් නිෂ්පාදනය වන අතර ඉතිරි 20% මෙරටට ඉන්දියාව මෙන් ම පකිස්ථානයෙන් ආනයනය කෙරේ. 1982 වසරේ සිට මෙරටට ලොකුළූණු වගාව හඳුන්වාදීමත් සමගම සමස්ථ ගෘහ ඒකකය තුළ පැවති ළූණු ඉල්ලුම තුළ රතුළූණු පාරිභෝජනය අඩු වී ලොකුළූණු පාරිභෝජනය ඉහළයාම ආරම්භ වූ අතර මෙය නාගරික පරිසරය තුළ කැපී පෙනෙන ලක්ෂණයකි. ඒ අනුව, රතුළූණු ජාතික අවශ්‍යතාවය තුළ ආනයනය සහ දේශීය සැපයුම පිළිබඳව මෙන් ම මෙරට රතුළූණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශය වන යාපනය ප්‍රදේශයෙන් නිෂ්පාදන රටාව පිළිබඳ විවරණයක යෙදීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

මෙරට සාමාන්‍ය වාර්ෂික රතුළූණු නිෂ්පාදනය කරනු ලබන භූමි ප්‍රමාණය හෙක්.5300ක් පමණ වන අතර ඉන් හෙක්ටයාර් 1200ක් පමණ යාපනය ප්‍රදේශයේ නිෂ්පාදනය කෙරේ. අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ වන්නේ පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය සහ පාලකුඩා ප්‍රදේශයන් සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවේලි ආශ්‍රිත ප්‍රදේශයකි. පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශය ආශ්‍රිත පාලකුඩා ගොවිජන සේවා බල ප්‍රදේශයේ බහුලව ළූණු වගා කෙරෙන අතර එහි අධික වැලි සහිත භූමියක ළූණු වගාව සිදුවීම තුළ ඉහළ රසායනික පොහොර ප්‍රමාණයක් යෙදීමට සිදුව තිබේ. එසේ වුව ද, රතුළූණු වගාවට සුදුසු යෝග්‍යතම බිමක් පවතින යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සහ පේදුරුතුඩුව ආශ්‍රිත ප්‍රදේශයන් අතිශය සාරවත් පසකින් යුත් වගාවන් සඳහාම යෝග්‍ය වූ බිමකි. ශ්‍රී ලංකාවේ පවතින සාරවත්ම පසකින් යුත් ඉතා හොඳම භූමියක් ලෙස යාපනය දිස්ත්‍රික්කයෙන් මෙම ප්‍රදේශය හඳුනාගත හැකිය. එහි කෙසෙල්, බීට්රූට්, කැරට්, ලීක්ස්, මිදි, ගෝවා, කරවිල, වම්බටු, පැපොල් වැනි සියළුම බෝගයන් බහුලව වගා කෙරේ. මේ තුළ රතුළූණු වගාවට ඉතා සුවිශේෂී තැනක් හිමි වී තිබේ. එනම්, ඒ සඳහා කන්න රටාවන් ද නොමැති අතර සෑම වසරකම බොහොමයක් ප්‍රදේශ තුළ තුන්වතාවක් වගා කෙරේ. සෑම කෘෂි බෝගයකටම ඉතා සුළු රසායනික පොහොර ප්‍රමාණයක් යෙදීම මෙම ප්‍රදේශයටම අවේණික සුවිශේෂ ලක්ෂණයයි. ප්‍රදේශයේ බහුලවම වෙසෙන ගව සම්පතින් ලැබෙන කාබනික ගොම පොහොර සෑම බෝගයකටම 90% ක් ම යොදා ගැනීම දැක ගත හැකි ය. රතුළූණු අක්කරයක් සඳහා යොදන සමස්ථ රසායනික පොහොර ප්‍රමාණය කිලෝ 300ක් පමණ වන විට, කාබනික ගොම පොහොර ප්‍රමාණය කිලෝ 14,000ක් පමණ යොදා ගැනීම සුවිශේෂී කරුණකි. එනම්, 3%කටත් වඩා අඩු රසායනික පොහොර භාවිතයක් පවතී. තවදුරටත් සඳහන් කරන්නේ නම් 97%ක් ම කාබනික පොහොර යොදා මෙසේ නිෂ්පාදනය වන යාපනයේ රතුළූණු පාරිභෝජනයට ඉතා සුදුසුම ගුණාත්මයෙන් ඉහළම රතුළූණු ලෙස හඳුන්වා දිය හැකි ය. රතුළූණු වල ප්‍රධාන වර්ග දෙක වන සිනන් හා වෙදාලන් යන දෙවර්ගයම මෙම ප්‍රදේශයෙහි බහුලව වගා කෙරේ. විශේෂයෙන් ම, පුත්තලම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්ගේ වගා බිම් සඳහා අවශ්‍ය වන ළූණු බීජ නිෂ්පාදනය මෙම ප්‍රදේශයෙන් සිදු වේ. පේදුරුතුඩුව ආශ්‍රිත අච්චුවේලි, ඉඩයික්කා, වලලායි පත්තයිමේන් වැනි ප්‍රදේශයන් සියල්ලම බීජ නිෂ්පාදනය සිදුකරන ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි ය. නිෂ්පාදනයේ දී ඔවුනට සුවිශේෂී ගැටළු නොමැති අතර කාබනික ගොම පොහොර භාවිතය ඉහළ මට්ටමක පැවතීමත්, රෝග ඉතාම අවම මට්ටමක පැවතීමටත් හේතු වී තිබේ. එසේම, අලෙවිය තුළ ද ගැටළු අවම මට්ටමක පවතී. මන්ද, ඔවුන්ගේ නිෂ්පාදන වලට බීජ ලෙස ඉහළ ඉල්ලුමක් කල්පිටිය වැනි ප්‍රදේශයන්ගේ පැවතීම හේතුවෙනි.

විශේෂයෙන් කෝපායි සහ නිලාවේලි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බහුලවම වගා කරන රතුළූණු පාරිභෝජනය සඳහා වෙළෙඳපොළට සැපයෙන අතර ඔවුන්ගේ ප්‍රධාන අලෙවි මධ්‍යස්ථානය වන්නේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සහ පිටකොටුව හතරවන හරස්වීදියේ තොග වෙළෙඳපොළ යි. මේ තුළ කොළඹ තොග වෙළෙඳපොළට සැපයෙන සෑම කිලෝ 50ක රතුළූණු බෑගයක් සඳහා රු.150.00 මුදලක් ප්‍රවාහන ගාස්තු ලෙස වැයවන අතර තොග වෙළෙඳපොළ තුළ 6%ක කොමිස් මුදලක් අලෙවි මිලෙන් ලබා ගනී. එසේම, සෑම බෑගයකින්ම කිලෝ ග්‍රෑම් 1-2 ක් ප්‍රමාණයක් අපතේ යාම ලෙස අඩු කෙරේ. ඒ අනුව, ඇත්ත වශයෙන් ම කිලෝ 50ක රතුළූණු බෑගයක් කොළඹ යැවීම තුළ වෙළෙඳපොළ තුළ රු.60.00 ක තොග මිලකට අලෙවි වන්නේ නම් යාපනයේ සිටින ගොවියාට ලැබෙන්නේ රු. 51.00 ක මිලකි. සියළුම අපතේ යාම් සහ වියදම් මෙන් ම මෙයට කොමිස් මුදල් ද සැලකූවිට කිලෝ එකක් සඳහා රු.9.00 ආසන්න මුදලක් යාපනයේ සිට කොළඹට විත් අලෙවියට ගොවියාට දැරීමට සිදුව තිබේ. ප්‍රදේශයේ පවතින ලොරි නිෂ්පාදකයන් අසලටම ගොස් මෙම නිෂ්පාදන රැස්කිරීම බහුලවම සිදුවන අතර ගොවියාට එතැන් සිට දින 4-5 ඇතුලත මුදල් ලැබීම සිදු වේ. වර්තමානයේ පවතින නිදහස් වෙළෙඳපොළ රටාවත් සමග කොළඹ සහ දඹුල්ල, යාපනය ප්‍රදේශයෙන් නිරන්තර නිෂ්පාදන හුවමාරුවීම් සිදු වේ. යාපනයේ අර්තාපල්, කැරට්, බීට්රූට්, ලීක්ස්, දඹුල්ල සහ පිටකොටුව තොග වෙළෙඳපොළ තුළ අලෙවි වන විට නුවරඑළිය කැරට්, බීට්රූට්, ලීක්ස්, යාපනයේ අලෙවි වීම බහුලව සිදු වේ. කෙසේ වුව ද, සමස්ථයක් ලෙස සියළුම වගාවන්ට ඉහළ කාබනික පොහොර යොදන ප්‍රදේශයන් ලෙස යාපනයේ නිෂ්පාදනයන් ඉහළ ගුණාත්වයෙන් යුත් ඒවා වීම පර්යේෂණ මට්ටමේ දී පැහැදිළි වේ. කෙසේ වුව ද, දැනට පවතින නිදහස් වෙළෙඳපොළ රටාව තුළ ඔවුන් සම්ප්‍රදායික ගොම පොහොර භාවිතය, බහුජාතික සමාගම් වන රසායනික පොහොර මෙන් ම විවිධ වූ කෘමිනාශක අලෙවිකරුවන්ගෙන් රැකගත යුතු වේ. එය පසේ දිගුකාලීන සාරවත්භාවයට මෙන් ම විවිධ වූ රෝග ව්‍යාප්තවීමට ද හේතු වේ. සියළු තත්ත්වයන් තුළින් යාපනය රතුළූණු පාරිභෝගිකයාට සුදුසු ගුණාත්වයෙන් ඉහළ 97%ක් පමණ කාබනික පොහොර යොදා නිෂ්පාදන කෙරෙන ශ්‍රී ලංකාවේ පාරිභෝජනයට සුදුසු ම රතුළූණු යාපනයේ රතුළූණු බව පැහැදිළි වේ.

විශේෂයෙන් ම, ආහාර සුරක්ෂිතභාවය සහ පෝෂණය පිළිබඳව ලෝකයේ ඉතා ඉහළින්ම සිටින රටක් වන තායිලන්තයේ ද මෙපමණ ඉහළ කාබනික ප්‍රතිශතයකින් යුතු රතුළූණු හෝ වෙනත් බෝගයන් ඉතා විරල ය. ඔවුන් ක්‍රමානුකූලව රසායනික පොහොර භාවිතය පහළ දමමින් සිටී. ශරීර සෞඛ්‍යයට අවශ්‍ය පෝෂණීය කාණ්ඩයන් රසායනික භාවිතය හේතුවෙන් විනාශ වන බැවින් පෝෂණය ගැන ඔවුන් ඉතා සැළකිලිමත් වේ. එවන් වූ බෝග රටාවන් පවතින ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශයක් ලෙස යාපනය දිස්ත්‍රික්කය සැලකීම නිවැරදි ය.

රජය ක්‍රියාත්මක කරනු ලබන දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහන තුළ එම ප්‍රදේශයේ ජනතාවට මේ වන විට නො මිලයේ එළවළු බීජ ලබාදීම සිදු වේ. කෙසේ වුව ද, රජයේ පොහොර සහනාධාරයට ඔවුන් ද හිමිකම් කීව ද ඔවුනට එහි සැලකිය යුතු බලපෑමක් සිදුව නොමැත. ඒ ඔවුන්ගේ නිෂ්පාදනය සඳහා 5%කටත් අඩු ප්‍රතිශතයක් රසායනික පොහොර භාවිතය සිදුවීම නිසා ය.

**ඩබ්.එම්. දුමින්ද ප්‍රියදර්ශන**
*පර්යේෂණ නිලධාරී*
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**'ගොවි ජනතා'**

මේ වන විට "ගොවිජනතා" සඟරාව වෙත ඔබ ලබා දී ඇති ලිපි ඉදිරි කලාපයන් හි අදාළ තේමාවන් යටතේ පළ කෙරෙන බව කරුණාවෙන් සලකන්න.

- සංස්කාරක -